# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1854/ 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 16/12/2024 පැය 1325

**පොලිස් මාධ්‍ය කොට්ඨාසයේ අධ්‍යක්ෂ හා මාධ්‍ය ප්‍රකාශක ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි බුද්ධික මනතුංග මහතා පොලිස් මාධ්‍ය කොට්ඨාසයේ රාජකාරි ආරම්භ කිරීම.**

ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී නීතිවේදී බුද්ධික මනතුංග මහතා 2024.12.02 වන දින පොලිස් මාධ්‍ය කොට්ඨාසයේ අධ්‍යක්ෂ හා පොලිස් මාධ්‍ය ප්‍රකාශක ලෙස පත්වීමෙන් අනතුරුව 2024.12.16 වන අද දින උදෑසන බත්තරමුල්ල, සුහුරුපාය, 14 වන මහලේ පිහිටි පොලිස් මාධ්‍ය කොට්ඨාසයට පැමිණ රාජකාරී ආරම්භ කරන ලදි.

කොළඹ ආනන්ද විද්‍යාලයේ ආදී ශිෂ්‍යයෙකු වන එතුමා පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ විද්‍යාවේදී පළමු උපාධිය හා විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධිධාරියෙකු වන අතර විවෘත විශ්ව විද්‍යාලයේ නීතිවේදි උපාධිධාරියෙකුද වේ. 2014.01.01 වන දින සහකාර පොලිස් අධිකාරිවරයෙකු වශයෙන් ශ්‍රී ලංකා පොලිස් සේවයට ඇතුළත්ව ඇති ඒ මහතා 2020.01.01 වන දින පොලිස් අධිකාරි තනතුරට හා 2024.01.01 වන දින ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි තනතුරට උසස්වීම් ලබා ඇත.

පොලිස් සේවයට සම්බන්ධ දේශීය පුහුණු පාඨමාලාවන් මෙන්ම රුසියාව, තායිලන්තය, පිලිපීනය හා කාම්බෝජියාව යන රටවල විදේශීය පුහුණු පාඨමාලාවන් රැසක් හදාරා ඇති ඒ මහතා මහනුවර, ත්‍රිකුණාමලය යන කොට්ඨාසවල රාජකාරි යෙදීමෙන් පසු මානව හිමිකම් කොට්ඨාසයේ අධ්‍යක්ෂ, පොලිස් මාධ්‍ය කොට්ඨාසය හා මහජන සම්බන්ධතා කොට්ඨාසයේ වැඩ බලන අධ්‍යක්ෂ, නීති කොට්ඨාසයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ, ළමා හා කාන්තා කාර්යංශයේ අධ්‍යක්ෂ හා කන්තලේ කොට්ඨාස භාර නිලධාරී ලෙස රාජකාරි ඉටු කර ඇත.

පොලිස් මාධ්‍ය ප්‍රකාශකතුමා 071 – 8591882 දරන දුරකථන අංකය ඔස්සේ සම්බන්ධ කර ගත හැකි අතර එතුමා 2024.12.16 වන දින පොලිස් මාධ්‍ය කොට්ඨාසයේ රාජකාරි ආරම්භ කිරීමේ අවස්ථාවට අදාල ඡායාරූප කිහිපයක් හා වීඩියෝ පටයක් මේ සමඟ ඔබ වෙත යොමු කරමි.





පොලිස් මාධ්‍ය කොට්ඨාසය.